පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

புடவைக் கைத்தொழில் திணைக்களம்

DEPARTMENT OF TEXTILE INDUSTRY

වැය ශීර්ෂ අංක: 303

செலவினத் தலைப்ப இலக்கம்: 303

Expenditure Head No: 303

3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10

3ஆம் மாடி,செயலகக் கட்டிடம், மாளிகாவத்தை, கொழும்பு 10

3rd Floor, Secretariat Building, Maligawatta, Colombo 10

අන්තර්ගතය

පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03: වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශකය

පරිච්ඡේදය 05: තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහය වීම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, ඇගයීම ඇතුළුව සියලු ම අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාළව පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර මධ්‍යස්ථාන මගින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය දැනුම හා නිපුණත්වයෙන් යුතු මානව සම්පත බිහි කිරීම සහ සංවර්ධනය කිරීම පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

2024 වර්ෂය තුළ පේෂ කර්මාන්ත දොපර්තමේන්තුව මගින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධනය සඳහා සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය මෙම වාර්තාවෙහි ඇතුළත් කර ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන් ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත් යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරඟකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම, අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

අරමුණු

- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සහ උපාය මාර්ගික සැලසුම්කරණය.
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ ඇගයීම සඳහා ආයතනික රාමුව ශක්තිමත් කිරීම සහ සම්බන්ධීකරණය.

- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ ධාරිතා සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීම.
- ක්ෂේත්‍රය සඳහා නව ශ්‍රමිකයින් පුහුණු කිරීම.
- ක්ෂේත්‍රය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ පහසුකම් සැපයීම.
- වෙළඳපොළ පුළුල් කිරීම සහ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
- පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඒකාබද්ධ සංවර්ධනය වෙනුවෙන් ආයතනික සම්බන්ධීකරණය.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සංවර්ධනය සඳහා අවශ්‍ය නවෝත්පාදන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ සංස්කෘතික උරුමයන් සහ සාම්ප්‍රදායික දැනුම සංරක්ෂණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා උපදේශකවරුන් සහ නවක ශිල්පීන් පුහුණු කිරීම.

- **පේෂ කර්මාන්ත පුහුණු ආයතන සඳහා පුහුණුලාභීන් බඳවාගෙන පුහුණු කිරීම.**

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් මඟින් පවත්වන පේෂ කර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි. මෙම පූර්ණකාලීන පාඨමාලා මගින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳව පුළුල් න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙයි.
ඒ අනුව 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා පුහුණුලාභීන් 110 දෙනෙකු බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. සුදුසුකම්ලත් පුහුණුලාභීන් සඳහා 2024 පෙබරවාරි මස 12 වන දින මෙම පාඨමාලාව ආරම්භ කරන ලදී.

2023 අධ්‍යයන වර්ෂයේ අධ්‍යාපනය ලබා පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගය සමත් වූ සහ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර නිර්මාණය පිළිබඳ උසස් පුහුණු සහතිකපත්‍ර විභාගය සමත් සිසු සිසුවියන් සඳහා 2024 ජූනි මස සහතිකපත් ප්‍රදානය සිදුකරන ලදී.

1.3.2 විභාග පැවැත්වීම

- **පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු**
  2024 වර්ෂයේ දී බඳවා ගත් සිසු සිසුවියන් සඳහා වන පේෂ කර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාගය 2025 පෙබරවාරි මස 19, 20 සහ 21 යන දිනයන්හි පවත්වන ලදි. මේ සඳහා පේෂ කර්මාන්ත පුහුණු ආයතනවල සිසුන් 52 දෙනෙකු හා බාහිර අයදුම්කරුවන් 19 දෙනෙකු පෙනී සිටින ලදි.

- **අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු පාඨමාලාව සම්බන්ධ විභාග කටයුතු**
  මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2023 අගෝස්තු මස බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2024 අගෝස්තු මස 12, 13 සහ 14 යන දිනවල පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලදි. ඒ සඳහා ගැටඹේ මෝස්තර පුහුණු ආයතනයේ සිසුන් 06 දෙනෙකු හා කටුබැද්ද මෝස්තර පුහුණු ආයතනයේ සිසුන් 08 දෙනෙකු පෙනී සිට ඇත. වර්ෂයක පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාව 2024 වර්ෂයේ අගෝස්තු මස කටුබැද්ද මෝස්තර ආයතනයේ දී ආරම්භ කරන ලදි.

1.3.3 ධාරිතා සංවර්ධන සහ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන්

- පේෂ කර්මාන්තයේ නියැලෙන ශිල්පීන්, ව්‍යවසායකයින් හා පේෂ කර්මාන්ත උපදේශකවරුන් දක්වා විහිදී යන පරිදි පේෂ කර්මාන්තයේ ගුණාත්මක සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ. කටුබැද්ද පර්යේෂණ, මෝස්තර, පුහුණු හා සේවා ආයතනයේ දී අත් යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නව ව්‍යවසායකයින් ලෙස පුහුණුලාභීන් 20 දෙනෙකු සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි.

  තවද, පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ධාරිතා සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් 2024 වර්ෂයේදී පුහුණුලාභීන් 317 දෙනෙකු සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් 20 ක් පවත්වන ලදි.

  තවද, ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් මගින් ක්ෂේත්‍රයේ නියුතුවූවන් 95 ක් සඳහා කෙටිකාලීන පුහුණු වැඩමුළු පවත්වන ලදි.

<u>2024 වර්ෂයේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු පාඨමාලා</u>

අනු අංකය	පාඨමාලාවේ නම	පැවැත් වූ දිනය	සහභාගී වූ සංඛ්‍යාව	පවත්වන ලද ස්ථානය
1	රෙදි සාම්පල විශ්ලේෂණය	2024.01.30 සිට 2024.01.31 දක්වා	12	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
2	ඩබල් ක්ලෝත් වියමන් මෝස්තර නිර්මාණය	2024.02.07 සිට 2024.02.09 දක්වා	16	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
3	වෝප් ප්‍රින්ටින් නිර්මාණය	2024.02.13 සිට 2024.02.15 දක්වා	13	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
4	බිත්ති සැරසිලි නිර්මාණය	2024.02.27 සිට 2024.02.29 දක්වා	20	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
5	ඩොබි මෝස්තර පුහුණුව	2024.03.11 සිට 2024.03.20 දක්වා	13	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
6	ටයි ඇන්ඩ් ඩයි	2024.04.02 සිට 2024.04.04 දක්වා	16	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
7	දික් බෝඩර් මෝස්තර නිර්මාණය	2024.04.24 සිට 2024.04.26 දක්වා	19	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය

8	ජම්දානි මෝස්තර නිර්මාණය	2024.05.07 සිට 2024.05.10 දක්වා	13	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
9	පල්ලු මෝස්තර	2024.05.27 සිට 2024.05.30 දක්වා	20	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
10	නූල් එතිමේ යන්ත්‍රය හැදින්වීම	2024.05.31	18	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
11	පෙතම්පිළි මෝස්තර	2024.06.05 සිට 2024.06.12 දක්වා	12	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
12	සත පහ මෝස්තර නිර්මාණය	2024.07.11 සිට 2024.07.13 දක්වා	15	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
13	ලෙනෝ වියමන් මෝස්තර	2024.07.29 සිට 2024.08.01 දක්වා	15	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
14	සැත්කම් ගෝස් නිර්මාණය	2024.08.26 සිට 2024.08.30 දක්වා	14	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
15	ස්වාභාවික වර්ණ ගැන්වීම	2024.10.05 සිට 2024.10.11 දක්වා	22	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
16	ලෙනෝ වියමන් මෝස්තර	2024.11.19 සිට 2024.11.22 දක්වා	19	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
17	සියසක වියමන් මෝස්තර	2024.12.17 සිට 2024.12.22 දක්වා	16	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
18	අත් යන්ත්‍ර රෙදි තුළින් ආභරණ නිර්මාණය	2024.11.05 සිට 2024-11-06 දක්වා	16	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
19	ඔසරිය හා සාරිය නිමි ඇඳුමක් ලෙස නිර්මාණය	2024.08.20 සිට 2024.08.23 දක්වා	12	කටුබැද්ද පේෂකර්මාන්ත පුහුණු ආයතනය
20	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන සංවර්ධන සංකල්ප	2024.12.16 සිට 2024.12.20 දක්වා	16	මොරටුව විශ්ව විද්‍යාලය

1.3.4 අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩමුළු පැවැත්වීම.

අනු අංකය	පාඨමාලාවේ නම	පැවැත් වූ දිනය	සහභාගී වූ සංඛ්‍යාව	පවත්වන ලද ස්ථානය
1	පල්ලු මෝස්තර	2024.02.26 සිට 2024.02.29 දක්වා	15	අම්පාර කර්මාන්ත දෙපාර්මේන්තුව
2	කුකුල් අඩි මෝස්තර	2024.03.05 සිට 2024.03.08 දක්වා	15	අම්පාර කර්මාන්ත දෙපාර්මේන්තුව
3	පල්ලු මෝස්තර	2024.02.13 සිට 2024.02.16 දක්වා	13	මරදගහමුල පේෂ කර්මාන්ත ආයතනය
4	හකබැක මෝස්තර	2024.07.02 සිට 2024.07.05 දක්වා	22	බෝයගනේ පේෂ කර්මාන්ත ආයතනය
5	වර්ණ සංයෝජන	2024.08.26 සිට 2024.08.30 දක්වා	15	ත්‍රිකුණාමලය කර්මාන්ත දෙපාර්තමේන්තුව
6	කැව්කාඩ් මෝස්තර	2024.05.06 සිට 2024.05.10 දක්වා	15	ත්‍රිකුණාමලය කර්මාන්ත දෙපාර්තමේන්තුව

1.3.5 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන ශිල්පීන් සඳහා වෘත්තීය සුදුසුකම් පිරිනැමීමේ අරමුණ සහිතව ශිල්පීන් 514 ක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ පූර්ව ඉගෙනුම් හඳුනා ගැනීමේ ක්‍රමවේදය ඔස්සේ ඇගයීමට ලක්කර ජාතික වෘත්තීය සුදුසුකම් 3 සහ 4 මට්ටම්වල සහතික ප්‍රදානය කරන ලදි.

1.3.6 පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා විදුලි බලයෙන් ක්‍රියාත්මක වන සාර්ථක නූල් එතීමේ යන්ත්‍රයක් පෞද්ගලික අංශය සහ පළාත් සභා වෙත හඳුන්වා දෙන ලදි.

1.3.7 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම

වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්ත කරලීමේ අරමුණෙන් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ දිස්ත්‍රික් ආවරණය වන පරිදි අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීමට මූලික කටයුතු කර ඇත.

අදාළ ප්‍රදේශවල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ මාස හයක පුහුණුව ලබා දීමෙන් පසු කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අත් යන්ත්‍ර උපකරණ හා අමු ද්‍රව්‍ය ගිවිසුම්ගත ලෙස ලබා දීමෙන් අනතුරුව පුහුණුව ලද ප්‍රතිලාභීන් කර්මාන්තගත කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව 2024 වර්ෂයේදී ආරම්භ කළ ව්‍යාපෘති විස්තර පහතින් දැක්වේ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	දිස්ත්‍රික්කය	පුහුණුලාභීන් සංඛ්‍යාව
1	ගල්ගමුව අත් යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	කුරුණෑගල	16
2	කලල්පිටිය අත් යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	ගම්පහ	15
3	ගාලේවැව අත් යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	කුරුණෑගල	13
4	මරළුවාව අත් යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	කුරුණෑගල	15
5	මාළිගාතැන්න අත් යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	ගම්පහ	16
6	හතරලියද්ද අත් යන්ත්‍ර පේෂකර්ම ව්‍යාපෘතිය	මහනුවර	11
මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව			**86**

1.3.8 ජාතික අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල පැවැත්වීම.

අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන් ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත් යන්ත්‍ර රෙදිපිළි තරඟයේ අවසන් විනිශ්චය කටයුතු 2024 ඔක්තෝම්බර් මස 25 වන දින කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතන පරිශ්‍රයේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී. එම තරඟයට අදාළව ජයග්‍රාහී ශිල්පීන් වෙත සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2024 දෙසැම්බර් මස 06 වෙනි දින ද, ජාතික ප්‍රදර්ශනය සහ අලෙවි සල්පිල 2024 දෙසැම්බර් මස 6,7 සහ 8 වන දිනවල ද, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදී.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.පරි.සේ I)
පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ - 02 (ශ්‍රී.ලං.වි.සේ I/II/III)
සහකාර අධ්‍යක්ෂ (පාලන) -01 (ශ්‍රී.ලං.පරි.සේ II/III)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) -01 (ශ්‍රී.ලං.පරි.සේ II/III)
අභ්‍යන්තර විගණක -01 (ශ්‍රී.ලං.ග.සේ II/III)
ගණකාධිකාරී -01 (ශ්‍රී.ලං.ග.සේ II/III)
පරිපාලන නිලධාරී -01 (කා.සේ.නි - අධිශ්‍රේණි)
කාර්මික නිලධාරී -01 (ශ්‍රී.ලං.තා.සේ II/III)
කළමනාකරණ සේවා නිලධාරී -11
රියදුරු -05
චිත්‍ර ශිල්පී -
සංවර්ධන නිලධාරී -01
කා.සේ.සේ -06
කම්කරු -05
මුරකරු -03
සංවර්ධන නිලධාරී -39
පේෂකර්ම උපදේශක -53
කවුළුද්ද අංශය සංවර්ධන නිලධාරී -03
පේෂකර්ම උපදේශක - 08
කා.සේ.සේ -03
කම්කරු -04
මුරකරු -15
කළමනාකරණ සේවා නිලධාරී -19
සංවර්ධන නිලධාරී -02
කා.සේ.සේ -01

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ආයතන අංශය
- සංවර්ධන අංශය
- ගිණුම් අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

i. පර්යේෂණ, පුහුණු, මෝස්තර හා සේවා ආයතනය
280/1, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.

ii. පේෂ කර්මාන්ත පුහුණු ආයතන සහ මෝස්තර පුහුණු ආයතන
පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් සහ මෝස්තර පුහුණු ආයතන 2 කි.

අනු අංකය	ආයතනය	ලිපිනය
01	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කටුබැද්ද	1/280, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
02	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කොට්ටල	කොට්ටල, වේයන්ගොඩ.
03	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - බෝයගනේ	බෝයගනේ, කුරුණෑගල.
04	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - පින්නවල	පින්නවල, රඹුක්කන.
05	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - වටපුළුව	අරුප්පල පාර, වටපුළුව, මහනුවර.
06	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - ගැටඹේ	ගැටඹේ, පේරාදෙණිය.
07	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - මාතලේ	කෝන්ගහමුල, පලාපත්වල, මාතලේ.

08	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - මාතර	හක්මන පාර, මාතර.
09	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - කිරම	මිද්දෙනිය පාර, කිරම.
10	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - බණ්ඩාරවෙල	කිණිගම, බණ්ඩාරවෙල.
11	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - තලාව	මිහිරිගම, තලාව.
12	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - ගාල්ල	කලේගාන පාර, ගිංතොට, ගාල්ල.
13	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - නල්ලූර්	194,පේදුරුතුඩුව පාර, නල්ලූර්, යාපනය.
14	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත පුහුණු ආයතනය - සමන්තුරේ	සමන්තුරේ.
15	උසස් මෝස්තර පුහුණු ආයතනය - කටුබැද්ද	1/280, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
16	උසස් මෝස්තර පුහුණු ආයතනය - ගැටඹේ	ගැටඹේ, පේරාදෙණිය.

පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ආයතනයේ ප්‍රගතිය

2 ජාතික අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත සහතික පත්‍ර එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවෙහි 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා පුහුණුලාභීන් 87ක් බඳවා ගන්නා ලද අතර මේ වන විට අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත. 2023/2024 අධ්‍යයන වර්ෂයේ එම පාඨමාලාව හැදෑරූ සිසුන් 85 ක් පමණ මේ වන විට ක්ෂේත්‍රයෙහි රැඳී සිටියි. මෙම පාඨමාලාවේ ගුණාත්මක සංවර්ධනය ඉලක්ක කර ගනිමින් විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම සහ සංශෝධනය කිරීම මෙම වර්ෂයේ දී සිදු කරන ලදි.

3 සේවාස්ථ පුහුණු පාඨමාලා යටතේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු වැඩමුළු 17ක් පවත්වා ඇත. මෙම පුහුණු වැඩමුළු සඳහා සහභාගි වූ බහුතරයක් පුහුණුලාභීන් පේෂ කර්මාන්ත උපදේශකවරුන් වන අතර එමඟින් නව මෝස්තර සංකල්ප ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

4 අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ පුහුණු වැඩ සටහන් 03 ක් පවත්වන ලද අතර මේ සඳහා ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් සහ ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ වශයෙන් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ ස්වයං රැකියාවල නිරත වන ශිල්පීන් සහභාගි විය. නිෂ්පාදන සංවර්ධනය ඉලක්ක කරගත් පුහුණු වැඩමුළු ලෙස මෙම වැඩසටහන් පවත්වන ලදි.

5 ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සහ කාන්තා සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් ග්‍රාමීය අත් යන්ත්‍ර පේෂකර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති 6ක් මගින් ප්‍රතිලාභීන් 86ක් පුහුණු කිරීමේ කණ්ඩායම් ව්‍යාපෘති ආරම්භ කර ඇත. එමගින් ස්වයං රැකියා ජනිත කිරීම ද නිරන්තර පසු විපරම් සහ පුහුණු මගින් ව්‍යවසායකයන් ලෙස සංවර්ධනය කිරීම ද අපේක්ෂිතය.

6 අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ භාවිතා වන විවිධ මෝස්තර රටා ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. මේ වන විට මෙවැනි අත්පොතක් ප්‍රකාශයට පත් කර නොමැති අතර ඒ සඳහා සාම්පල සකස් කිරීමේ කාර්යයන් සිදු කරමින් පවතියි.

7 නව පර්යේෂණ යටතේ විවිධ අමු ද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදන සාම්පල් සකස් කර ඇත. එම සාම්පල පරිපූර්ණ නිෂ්පාදන ලෙස සංවර්ධනය කිරීමේ ශක්‍යතාව පිළිබඳ පර්යේෂණ කරමින් පවතියි.

8 පුහුණුලාභීන් සඳහා ගුණාත්මකභාවයෙන් යුතු ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමේ ඉලක්ක කර ගනිමින් පුහුණු ආයතන අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදි. ඒ අනුව බෝයගනේ පේෂකර්මාන්ත පුහුණු ආයතනයේ වහලයේ අළුත්වැඩියා කටයුතු නිමකර ඇත. මෙරට එකම අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මෝස්තර පුහුණු ආයතනය වන කටුබැද්ද පේෂ කර්මාන්ත පුහුණු ආයතනයේ වහලය හා සිවිලිම අළුත්වැඩියාව කොටසක් නිම කර ඇත.

2.2 ආයතනයේ ඉදිරි දැක්ම

❖ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන්.

- පේෂකර්මාන්ත පුහුණු ආයතන මඟින් පේෂකර්මාන්තයේ සක්‍රියව නියැලී සිටින ශිල්පීන් 100 ක් පුහුණු කිරීම.
- පේෂකර්මාන්ත පුහුනු ආයතනවල විෂය මාලා ජාතික වෘත්තීය සුදුසුකම් තත්වයන්ට සමපාත වන ලෙස සංවර්ධනය කිරීම.
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- සේවාස්ථ පුහුණු වැඩසටහන් හා මෝස්තර පාඨමාලා 25 ක් පැවැත්වීම මඟින් පේෂ කර්මාන්තයේ නියැලෙන ශිල්පීන් 400 ක් පුහුණු කිරීම.
- නිෂ්පාදන විවිධාංගීකරණ පාඨමාලා හඳුන්වා දීම.
- අත් යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය.
- ග්‍රාමීය ප්‍රදේශවල අත් යන්ත්‍ර කර්මාන්තයේ නියුතුවූවන් සඳහා මෝස්තර වැඩමුළු පැවැත්වීම.
- පළාත් රාජ්‍ය, සමුපකාර හා පෞද්ගලික අංශයේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු උපදේශකවරුන් හා නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය වන කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.

❖ අත් යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති

- ග්‍රාමීය මට්ටමෙන් අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම.
- උක්ත ව්‍යාපෘති මඟින් පේෂ කර්මාන්තයේ සක්‍රියව නියැලී සිටින ශිල්පීන් 100 ක් බිහි කිරීම.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා ශිල්පීන් යොමු කිරීමේ වැඩසටහන්.

❖ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

- අත් යන්ත්‍ර පේෂකර්මාන්ත උපකරණ සහ උපාංග වැඩිදියුණු කිරීම.
- ස්වාභාවික වර්ණ උපයෝගි කරගත් අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හඳුන්වාදීම සඳහා වැඩසටහන් පුළුල් කිරීම.
- අත් යන්ත්‍ර මෝස්තර සඳහා වන මෝස්තර ග්‍රන්ථය සම්පාදනය සහ ක්ෂේත්‍රයට හඳුන්වා දීම.

❖ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ප්‍රවර්ධන වැඩසටහන්.

- ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය සහ සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි සල්පිල් දෙකක් වර්ෂය තුළ පැවැත්වීම.

❖ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය
    • පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් පුහුණු මධ්‍යස්ථානවල හඳුනාගත් අත්‍යවශ්‍ය අළුත්වැඩියා සිදු කිරීම.

2.3 අභියෝග

❖ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති විම.

❖ තාක්ෂණික දැනුම සහිත තනතුරු දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලයෙහි නොමැති වීම.

❖ ප්‍රමාණවත් ඉඩ හා පහසුකම් සහිත සේවා ස්ථානයක් නොමැති වීම.

❖ අනුමතව ඇති සීමිත කාර්ය මණ්ඩලය තුළ ද තනතුරු පුරප්පාඩු පැවතීම.

❖ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දිනෙන් දින ඉහළයාම.

❖ අත් යන්ත්‍ර නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් වෙළදපොළ අවස්ථා නොමැති වීම.

❖ අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන වලට අගය එකතු කිරීමක් සිදුනොවීම සහ විදේශ වෙළදපොළ ඉලක්ක කර නොගැනීම.

2.4 ආයතන ප්‍රධානියාගේ අත්සන

නම : යූ.වී.එස්.සේනානි සෙනෙවිරත්න
තනතුර: අධ්‍යක්ෂ

පරිච්ඡේදය 03 :සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය		සටහන	තත්‍ය		
(වර්තමාන වර්ෂය)			වර්තමාන වර්ෂය රු.ශත		ඉකුත් වර්ෂය රු.ශත
-	**ආදායම් ලැබීම්**		-		-
-	ආදායම් බදු	1	-		-
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		-
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-		-
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-		-
-	**මුළු ආදායම් ලැබීම්(අ)**		-		**-**
-	**ආදායම් නොවන ලැබීම්**		-		-
-	භාණ්ඩාගාර අග්‍රිම		150,484,000.00		116,717,000.00
-	තැන්පතු		7,665,988.00		499,579.00
-	අත්තිකාරම් ගිණුම්		8,450,935.00		6,366,570.00
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම		-		-
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**166,600,923.00**		**123,583,149.00**
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**166,600,923.00**		**123,583,149.00**
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)**		**-**		**1,200,000.00**
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඈ)**		**166,600,923.00**		**123,583,149.00**
-	**අඩු කළා : වියදම**		-		-
-	**පුනරාවර්තන වියදම්**		-		-
86,920,000.00	වේතන, වැටුප් සහ අනෙකුත්	5	82,364,725.00		70,068,156.00

	සේවක ප්‍රතිලාභ				
28,090,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	24,285,964.00		23,415,183.00
214,560,000.00	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	208,334,646.00		253,780,653.00
-	පොළී ගෙවීම්	8	-		-
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-		-
329,570,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**314,985,335.00**		**347,263,991.00**
	මූලධන වියදම්				
33,200,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	11,395,349.00		7,949,094.00
1,700,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	239,989.00		-
-	ප්‍රාග්ධන මාරු කිරීම	12	-		-
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-		-
-	හැකියා වර්ධනය	14	-		-
44,000,000.00	වෙනත් මූලධන වියදම්	15	40,990,810.00		27,448,614.00
78,900,000.00	**මුළු මූලධන වියදම (උ)**		**52,626,149.00**		**35,397,708.00**
	තැන්පතු ගෙවීම		7,454,760.00		257,180.00
	අත්තිකාරම් ගෙවීම		6,484,727.00		6,333,064.00
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම		-		-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**13,939,487.00**		**6,590,244.00**
	මුළු වියදම එ = (ඊ +උ +ඌ)		**381,550,971.00**		**389,251,943.00**
408,470,000.00	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)**		**(214,950,048.00)**		**(266,868,794.00)**
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(214,950,048.00)**		**(267,097,794.00)** **229,000.00**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**-**		**229,000.00**

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඑ-8

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඑ-6	246,495,516	268,815,527
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඑ-5/5(ඒ)	17,200,894	19,167,102
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඑ-3	-	229,000
මුළු වත්කම්		263,696,410	288,211,629
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		16,628,567	19,035,003
දේපළ පිරියත හා උපකරණ සංචිතය		246,495,516	268,815,527
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඑ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඑ-4	572,327	361,099
අග්‍රිම ශේෂය	ඒසිඑ-3	-	-
මුළු වගකීම්		263,696,410	288,211,629

පිටු අංක......2....සිට ......27... දක්වා ඒසිඑ 1 සිට ඒසිඑ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ......28.... සිට ......36.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සටහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 27/02/2025	දිනය : 20/02/2025	දිනය : 18/02/2025
ජේ.එම්. තිලකා ජයසුන්දර ලේකම් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03.	යූ.වී.එස්. සේනානි සෙනෙවිරත්න අධ්‍යක්ෂ රේඛ කර්මාන්ත දෙපාර්තමේන්තුව 3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10.	එච්. පී. නන්දනී ගණකාධිකාරී රේඛ කර්මාන්ත දෙපාර්තමේන්තුව 3 වන මහල, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල, මාලිගාවත්ත, කොළඹ 10.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තතා	
	වර්තමාන වර්ෂය රු.ශත	ඉකුත් වර්ෂය රු.ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිහාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	8,237,986.00	5,900,551,.00
අග්‍රිම ලැබීම්	150,484,000.00	116,717,000.00
අත්තිකාරම් අයකර ගැනීම		5,216,810.00
තැම්පතු ලැබීම්	7,665,988.00	499,579.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**171,281,989.00**	**128,333,940.00**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	106,305,189.00	92,385,868.00
සහනාධාර සහ මාරු කිරීම්	1,025,923.00	233,870.00
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	9,129,576.00	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	229,000.00	1,200,000.00
අත්තිකාරම් ගෙවීම්	4,711,022.00	6,333,064.00
තැන්පතු ගෙවීම	7,454,760.00	257,180.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**128,855,470.00**	**100,409,982.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**42,426,514.00**	**27,923,958.00**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-

හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		-
<u>අඩු කළා - මුදල් වැය කිරීම්;</u>		
මූලධන වියදම්	**42,655,519.00**	**27,694,958.00**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**42,655,519.00**	**27,694,958.00**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(42,655,519.00)**	**(27,694,958.00)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**-**	**229,000.00**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්;</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)		**229,000.00**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**229,000.00**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **ආදායම් හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇතිවිට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.00 2002.01.01	**කුලී** රජයේ ගොඩනැගිලි කුලී	800,000.00	800,000.00	2,429,910.00	303%
2002.02.99	**පොළිය -** වෙනත්	750,000.00	750,000.00	670,672.00	
2003.99.00	**අනෙකුත් ලැබීම්**	900,000.00	900,000.00	1,756,704.00	
2004.01.00 2004.01.00	**සමාජ සංරක්ෂණ දායක මුදල්** මධ්‍යම රජය	3,300,000.00	3,300,000.00	3,390,700.00	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	**අවසාන ප්‍රතිපාදනය**		
පුනරාවර්තන	320,800,000.00	329,570,000.00	314,985,335.00	98.18 %
ප්‍රාග්ධන	78,900,000.00	78,900,000.00	52,626,149.00	66.70 %

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදන රු.		
130	පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම	-	-	-	-
149	කර්මාන්ත අමාත්‍යාංශය	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය - NVQ සහතික ලබා ගැනීම	16,540,000.00	16,540,000.00	9,129,576.00	55.19%
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	අත්තිකාරම් ණය පියවීම	1,495,449.00	1,495,449.00	1,495,449.00	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	118,816,125.00	118,816,125.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	50,070,083.00	50,070,083.00	-	100%
9153	ඉඩම්	86,161,850.00	86,161,850.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/D/DTI/ 2024/10 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 28 දින.

අධ්‍යක්ෂ
පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.ආර්.එන්. වීරක්කොඩි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩ බලන විගණකාධිපති වෙනුවට

පිටපත : - 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
02. ලේකම්- කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

IMT/D/DTI/ 2024/10 2025 මැයි 28 දින.

අධ්‍යක්ෂ
පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

2

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

3

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පේෂකර්ම දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි 04 ක් බදු දීමට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.11,437,450 ක බදු කුලියක් හිඟව පැවතුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීමෙන් පසුවද එම වැය විෂයයන් හි ශුද්ධ ප්‍රතිපාදනය මත තවදුරටත් ඉතිරිවීම් සියයට 27 සිට 42 ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.

(ආ) මූලධන වැය විෂයයන් යටතේ වන මෘදුකාංග සංවර්ධනය සඳහා වෙන්කර තිබූ රු.1,900,000 ක ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා රු.450,000 ක් මාරු කිරීම සිදුකිරීමෙන් පසුවද එම වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදනය රු.1.450,000 ක් ඉතිරිව පැවතුණි.

(ඇ) මූලධන වැය විෂයයන් යටතේ පවතින ගොඩනැගිලි හා ඉදිකිරීම් වෙනුවෙන් රු.27,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, මුදල් රෙගුලාසි 66 යටතේ තවත් රු.5,000,000 ක් මාරුකර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට වැය වී තිබුණේ රු.295,190 ක් ලෙස මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6.88 ක් පමණක් විය.

(ඈ) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ, පේෂකර්ම පුහුණු පාසල්වල සහ සංචාරක බංගලාවලින් විදුලිබල මණ්ඩලය වෙත ගෙවිය යුතු 2024 නොවැම්බර් - දෙසැම්බර්

4

කාලයට අදාළ රු.61,243 ක වටිනාකමැති හිඟ ශේෂ 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකිරීම නිසා නල්ලූර් පේෂකර්ම පුහුණු පාසල ඇතුළු, පාසල් කිහිපයකට රතු නිවේදන ලැබී තිබූ අවස්ථා පැවතුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව		නිරීක්ෂණය
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(අ)	මු.රෙ. 94 (2) සහ (3)	2024 වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් වර්ග 08 ක එකතු වටිනාකම රු.611,923 ක් 2025 වර්ෂයේ නිරවුල් කර තිබුණද ඒවා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන බැරකම් පිළිබද ප්‍රකාශනයෙහි සටහන් කර නොතිබුණි.
(ආ)	මු.රෙ. 371 (5)	අවස්ථා 18 කදී ලබාදී තිබූ රු.140,500 ක අත්තිකාරම් පියවීම සඳහා මාස 01 ත් මාස 1 ½ ක් අතර කාලයක් ගතවී තිබුණි.
(ඇ)	මු.රෙ. 396	වටිනාකම රු.544,731 ක් වූ මාස 06 කට වඩා වැඩි කාලයක් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඉ)	මු.රෙ. 757 (2)	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් විනාශ කිරීමට නිර්දේශ කළ අයිතම 99 ක්, විකිණීමට නිර්දේශ කළ අයිතම 22 ක් සඳහා ලබාදුන් නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.
(ii)	2024 ජනවාරි 10 දිනැති අංක.01/2024 ජාතික අයවැය චක්‍රලේඛයෙහි 2.1 වගන්තිය	අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් සඳහා රු.200,000 ක් මු.රෙ.66 යටතේ මාරුකරගෙන තිබුණි.

5

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

සමාලෝචිත වර්ෂයේ පේෂකර්ම පුහුණු පාසැල් 14 කට පේෂ කර්ම සහතිකපත් පාඨමාලාව සඳහා සිසුන් 102 ක් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණු අතර එයින් පාඨමාලාව සඳහා සිසුන් 67 දෙනෙකු සහභාගී වී තිබුණද පාඨමාලාව සම්පූර්ණ කර තිබුණේ සිසුන් 42 ක් පමණි. වටපුළුව, මාතර, තලාව සහ කටුබැද්ද පුහුණු පාසැල් මගින් කිසිදු සිසුවෙකු පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ). 2024 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1.4 ක් වෙන්කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම වෙන්කළ මුළු ප්‍රතිපාදනයම වැය නොකර ඉතිරිව පැවතුණි.

(ආ). කිරම, බෝයගනේ, බණ්ඩාරවෙල හා කටුබැද්ද පිහිටි පේෂකර්ම පාසල්වලට අයත් ගොඩනැගිලි සංවර්ධන කටයුතු සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 32 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැයකර තිබුණේ රුපියල් මිලියන 2.2 ක් වීම නිසා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 93.12 ක්ම ඉතිරිව පැවතුණි.

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණු නමුත් පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) කටුබැද්ද කාර්යාලයේ සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ලොකු ඩමි 18 ක් හා ළමා ඩමි 02 ක් පවතින බවට වාර්තා කර තිබුණු අතර 2024 වර්ෂයේ ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟාවලිය සහ ප්‍රදර්ශනය සඳහා මිළදීගෙන තිබුණු ඩමි 30 ක් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

6

(ආ) පේෂකර්ම පුහුණු පාසල් සඳහා බෙදාහැරීමට 2016, 2020 හා 2022 වර්ෂවල මිලදීගෙන හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පරිගණක පුටු 02 ක්, අයන් ටේබල් 09 ක්, ප්ලාස්ටික් පුටු 25 ක්, ලාච්චු 04 කබඩ් 02 ක් හා පොත් රාක්ක 02 ක් විගණිත දිනය වන 2025 ජනවාරි 27 දින දක්වාම ගබඩා පරිශ්‍රය තුළ නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2021 වර්ෂයේ ලද පරිත්‍යාග ලෙස ලැබී තිබූ ප්ලාස්ටික් පුටු 25 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුව හා පුහුණු පාසැල්වල පවතින කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, ලී බඩු ඇතුළු වෙනත් යන්ත්‍ර හා උපකරණ වෙනුවෙන් සිදුකරනු ලබන භාණ්ඩ සමීක්ෂණයේදී නිර්දේශ කරනු ලබන විනාශ කිරීම් (D) වෙන්දේසි කිරීම් (S) නිසි කාල වලදී සිදු නොකිරීම නිසා එම අයිතමයන්හි වටිනාකම් ගිණුම්වලින් ඉවත් වීමක් සිදු නොවීම නිසා මූල්‍ය නොවන වත්කම් යටතේ වන වෙනත් යන්ත්‍ර හා උපකරණවල අගය රු.24,167,541 ක වටිනාකම නිවැරදි නොවන අගයක් විය.

4.3 පාඩු හා හානි

පේෂකර්ම පුහුණු පාසල් හරහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය නූල් කටුබැද්ද ගබඩා පරිශ්‍රය තුළ ගබඩා කර තිබූ අතර එම නූල් තොග අතුරින් 2024 දෙසැම්බර් 31 දිනට 2/80 ග්‍රේ හා 2/80 සුදු නූල් පිළිවෙලින් 105.640kg හා 420.540kg ක් ඉතිරි වී තිබුණි. 2024 ජනවාරි 07 සිදුකළ විගණන පරීක්ෂාවේදී එම (2/80 ග්‍රේ හා 2/80 සුදු) නූල් තොගවලින් පිළිවෙලින් 28.84kg 10.50kg ක නූල් ප්‍රමාණයක් භාවිතයට ගැනීමට නොහැකි ලෙසට හානි වී තිබූ බවට නිරීක්ෂණය විය. තවද මෙම නූල් තොග හානිවීම කෙරෙහි ගබඩා පරිශ්‍රයේ පවිත්‍රතාවය අඩු මට්ටමක පැවතීම හා විධිමත් ක්‍රමවේදයකට අනුව නූල්තොග ගබඩා නොකිරීම නිසා ඇතිවූ කෘමි හානි සෘජුවම බලපා තිබුණි.

4.4 අනාර්ථික ගනුදෙනු

(අ). කොරෝනා වසංගත කාලයේ පේෂකර්ම පුහුණු පාසල් සඳහා බෙදාහැරීමට 2021 දෙසැම්බර් 30 දින උෂ්ණත්වය මැනීම සඳහා භාවිතා කරන උපකරණ (Thermometer) 14 ක් මිලදී ගෙන තිබූ අතර ඉන් උපකරණ 07 ක් පුහුණු පාසල් වෙත ලබා නොදීම හේතුවෙන් මෙම විගණන වාර්තාවේ සඳහන් දිනය වන 2025 මැයි 15 දින වන විටත් ගබඩා පරිශ්‍රය තුළ නිෂ්කාර්යව පැවතුණි.

7

(ආ). 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ගබඩා පරිශ්‍රයේ 4L සැනිටයිසර් බෝතල් 07 ක් හා කුඩා පරිමාණයේ සැනිටයිසර් බෝතල් 11 ක් හා වාහන සේදුම් දියර බෝතල් 13 ක් කල් ඉකුත් වී පවතින බවට භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය වී තිබුණි. අවශ්‍යතාවය හඳුනාගෙන සිදුකරන ලද මිළදී ගැනීම් තුළින් උක්ත ද්‍රව්‍ය සඳහා දැරූ වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී ඇතත් පුරප්පාඩු සම්පූර්ණ වී නොතිබුණි. මේ හේතුවෙන් විධිමත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව 2024 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

ඩබ්ලිව්.ජී.ආර්.එන්.වීරක්කොඩි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩ බලන විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 04 : කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

	විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
1	පේෂකර්මාන්ත පුහුණු ආයතන මගින් නවක සිසුන් 110 දෙනෙකු පුහුණු කිරීම		√	
	ධාරිතා සංවර්ධනය යටතේ කෙටිකාලීන පුහුණු පාඨමාලා 25ක් පැවැත්වීම	√		
	ග්‍රාමීය මට්ටමේ ස්වයං රැකියා කණ්ඩායම් ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීම		√	
	ග්‍රාමීය මට්ටමේ ශිල්පීන් ඉලක්ක කර ගනිමින් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම		√	
	ජාතික අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත තරඟය, ප්‍රදර්ශනය පැවැත්වීම	√		
	අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් 50ක් සඳහා අලෙවි සල්පිල මගින් අලෙවි පහසුකම් සැලසීම සහ නිෂ්පාදන ප්‍රවර්ධනය	√		

පරිච්ඡේදය 05 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50%-74%	75% - 100%
4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම	2030 වසර වන විට අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නවක වෘත්තිකයින් 1000ක් පුහුණු කිරීම	2024 වසර ඇතුළත නවක වෘත්තිකයින් 158 ක් පුහුණු කර ඇත.		√	
9.2 සියලුදෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම	2030 වසර වන විට අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නව රැකියා 800ක් ජනිත කිරීම	2024 වසර තුළ අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නව රැකියා 84ක් ආරම්භ කිරීම.	√		

පරිච්ඡේදය 06 :මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	07	04	03
තෘතියික	01	01	0
ද්විතියික	128	83	40
ප්‍රාථමික	42	29	13

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය

- දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාලීම සඳහා මානව සම්පත් හිඟය දැඩි බලපෑමක් එල්ල කර ඇත. තාක්ෂණික තනතුරුවල මෙන්ම සංවර්ධන නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරි ආදී සියලු තනතුරුවල පුරප්පාඩු පවතියි. අභ්‍යන්තර විගණක තනතුර ද පුරප්පාඩුව පවතියි.

- තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරක් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙහි ඇතුළත් නොවන බැවින් තොරතුරු තාක්ෂණ කටයුතු සිදුකර ගැනීමේ දී මහත් අපහසුතාවයන්ට ලක්වීමට සිදුව ඇත.

- තවද, පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් වල යෙදවීමට සුදුසුකම් සහිත නිලධාරීන් දෙපාර්මේන්තුවේ නොමැති අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික තනතුරු ද අනුමතව නොමැත. එම තත්වය ද කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීමේ දී අහිතකර ලෙස බලපා ඇත.

පරිච්ඡේදය 07 :අනුකූලතා වාර්තාව

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල්ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය** (මූ.රෙ.135)			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම.	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා පුරප්පාඩුවක් ඇත	පුරප්පාඩුව පිරවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිර	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුව ම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව භාර දී තිබීම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

	අදාළ කර ගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		